## 5.1 - නර්තන කලාව හා සබැඳි මූලාශ්‍රය හඳුනා ගනිමු.

නිපුණතාවය : ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි..

ක්‍රියාකාරකම : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය හඳුනා ගනිමු.
(සෙල් ලිපි හා සංදේශ කාව්‍ය)

ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේශනයේ දී උපයෝගී කරගත හැකි මූලාශ්‍රය වර්ග කීපයක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

- වංශකථා
- සෙල්ලිපි
- සාහිත්‍ය කෘති
- රූකම්
- සන්දේශ කාව්‍ය
- දේශ සංචාරකයන්ගේ වාර්තා


ශ්‍රී ලාංකේය නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු, මූලාශ්‍රය වශයෙන් ගෙන විමසීම වඩාත් වැදගත් වේ.

ඉහත මූලාශ්‍රය යටතේ සෙල්ලිපි, සන්දේශ කාව්‍ය ඇසුරින් නර්තන කලාව පැවති බවට සාධක කීපයක් හඳුනාගත හැකි ය.

### සෙල්ලිපි, සන්දේශ කාව්‍ය

**සෙල්ලිපි :-**

අතීතයේ විවිධ පුද්ගලයන් ඔවුන් විසින් යමක් සමාජයට ප්‍රසිද්ධ කිරීම උදෙසා සෙල් ලිපි ලියන ලදී. සෙල් ලිපි යනු පාෂාණ මත අකුරු කෙටීම මගින් ලියනු ලැබූ ඒවාය. මේ සඳහා විවිධ යුගවලදී විවිධ අක්ෂර භාවිතා කර තිබේ. සෙල්ලිපි ප්‍රධාන වශයෙන් වර්ග කිහිපයක් හඳුනාගැනීමට පුළුවන.





**නර්තන කලාව හා සම්බන්දයෙන් වැදගත් සෙල්ලිපි :-**


අනුරාධපුර යුගය :- සැස්සේරුව සෙල් ලිපිය - ක්‍රි.ව. 1-2 සියවස්වලට අයත් සැස්සේරුව සෙල්ලිපියේ "නටන ගහපතියා විසින් පවරා දෙන ලදි" යනුවෙන් සඳහන් වේ.ගෘහපතියා යනුවෙන් නැටුම් පරම්පරාවක් සිටි බව එයින ගම්‍ය වේ.

කොරවක්ගල ලෙන් ලිපිය - නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වේ. මෙහි 'ගහපතියා' යනුවෙන් දැක්වෙන්නේ නැටුම් පරම්පරාවක් සිටි බව ය. ඒ අනුව පරම් පරාවෙන් පරම්පරාවට නැටුම් පවරා දුන් බව ගම්‍ය වේ.

පොළොන්නරු යුගය :- පාලමොට්ටායි සෙල් ලිපිය - මෙම ශිලා ලිපිය අනුව දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටූ බවත් ලංකාව සොළීන්ට යටත් වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වීම ආරම්භ වූ බවත් පෙනේ. මෙම ලිපියට අනුව නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත්දෙනකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් කළ මුදලක පොළියෙන් කාසි ගෙවූ බවත් කියැවේ.

කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපිය - කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩහිඳිනා සිංහාසනය යි, යනුවෙන් කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ සඳහන් වේ.









විවිධ සෙල්ලිපි

සන්දේශ කාව්‍යය :-

යම්කිසි පණිවිඩයක් දූතයෙකු මඟින් යැවීම නිසා සංදේශ කාව්‍යයන් බිහිවිය. එමගින් දූතයාගේ ගමන් මග විසිතුරු ඔහුට යන මාර්ගය පිළිබඳ තොරතුරු ඔහුට දක්නට ලැබෙන ස්ථාන, පුද්ගලයින්, සිද්ධි, ආදීය කවිය උපයෝගී කරගන්මින් වර්ණනා කිරීම සංදේශ කාව්‍යයවල ලක්ෂණයයි.බොහෝ සංදේශ ලියවුනේ කෝට්ටේ යුගයේදී උවද ගම්පොළ යුගයේදි පටන් මෙරට සංදේශ කාව්‍ය රචනා වී තිබේ. සංදේශ කාව්‍ය ගණනාවක් අපේ දේශීය සාහිත්‍යය තුළ හදුනාගැනීමට හැකිය.




තිසර සන්දේශය :- තිසර සන්දේශ කාව්‍ය 14 වැනි සියවසේ ලියන ලද බව පිළිගැනේ. මෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.




| |
|---|
| තහලම් තල බෙර තම්මැට පට තන්තිරි ඩමුරු<br>තඹ මේ ටක බෙර බොම්බිලි වීණා මිණි සුසිරු<br>බෙර මද්දල කහලම් රසු තිගළම් බඳ සොඳුරු<br>මෙසියල් මහ ගිගුමෙන් පළ කෙරෙමින් සිඳු අයුරු |

| |
|---|
| නිලුපුල් දිගැසී තන රණ කලසී<br>විදුලිය සදිසී සියුමැලි දිගැසී<br>රඟ බැස නොලසී රඟ දෙන විලසී<br>දුටු එම විගසී මද තෙම ඇවිසී |

සැළලිහිණි සන්දේශය - කෝට්ටේ යුගයේදී රචනා වී ඇති මෙහිද නර්තන කලාව පිළිබඳව තොරතුරු දක්නට ලැබේ.





| |
|---|
| විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී<br>හෙළන නගන අත නුවනග බැලුම් දිදී<br>රුවන දිලෙන අබරණ කැලුම ගත යෙදී<br>සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී |

| |
|---|
| ලකල පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා<br>සමඟ රන් සළඹ රැවු දී වෙවුල්ලා<br>වයන පදට තබමින් පද කමල්ලා<br>රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා |

පරවි සන්දේශය - මෙයද කෝට්ටේ යුගයේදී රචනා වී ඇති අතර මෙහිද නර්තන කලාව පිළිබඳව තොරතුරු දක්නට ලැබේ.

ලෙළදුන් නව තඹ පලු වන් පාදේ
තබමින් නිවරද මද්දල නාදේ
ගයමින් පානා ගීයෙන් කීදේ
අඟනන් රඟ දුටුවන් සිතු පැදේ

ලෙළෙනා දිගු නෙත තිලුපුල සේයා
ලෙළ පවනින් රන් ලිය විලසේයා
නළඟන රඟනා දක නොලසේයා
නළඟන නුවනත රඟ සැලැසේයා




ඇගයීම :-

1. සෙල්ලිපි ඇතුළත් යුග නම් කරන්න
2. සෙල්ලිපි වල සඳහන් තොරතුරු විස්තර කරන්න.
3. සන්දේශ කාව්‍යය අයත් යුග නම් කරන්න.
4. සන්දේශ කාව්‍ය අතුරින් නළඟන රැඟුම් විස්තර කෙරෙන්නේ කුමන ඒවායින්ද?
5. සාහිත්‍ය කෘතින් ලෙස සන්දේශ කාව්‍යය ඇගයිමකට ලක් කරන්න.

සැකසුම - I.A.N.S. ඉලේපෙරුම, ර/ නිරි ඇල්ල මහා විද්‍යාලය, නිරි ඇල්ල.